එච්. එම්. විජිත හේරත්, පා. ම.
எச். எம். விஜித ஹேரத், பா. உ.
H. M. Vijitha Herath, M. P.
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
Minister of Foreign Affairs, Foreign Employment and Tourism

# නිදහස් දින පණිවුඩය – 2026

අපගේ ජාතියේ අනාගතය පිළිබඳ නවමු අපේක්ෂාවන් සහ විශ්වාසය පෙරදැරි කරගනිමින්, අප විසින් ජාතික නිදහසේ 78 වැනි සංවත්සරය සනිටුහන් කරන, ශ්‍රී ලංකා ඉතිහාසයේ තීරණාත්මක අවස්ථාවක් වන මේ මොහොතේ, මම, මෙරටෙහි සහ ලොව පුරා වෙසෙන සියලුම ශ්‍රී ලාංකිකයින්ට මාගේ උණුසුම් සුබ පැතුම් පිරිනමමි.

නිදහස් දිනය යනු හුදෙක් අපගේ ජයග්‍රහණ සැමරීමේ උත්සවයක් පමණක් නොව, අප මුහුණ දී ඇති සහ අප ඉදිරියේ පවතින අභියෝග පිළිබඳව සිහිපත් කිරීමට සහ එම අභියෝග ජය ගැනීම සඳහා වන අපගේ සාමූහික අධිෂ්ඨානය යළි නඟා සිටුවීමට ලැබී ඇති අවස්ථාවක් ද වේ. අපගේ ජනතාව විසින් බලගන්වා ඇති ප්‍රජාතන්ත්‍රවාදී තේරීම තුළින් ගොඩනැගුණු ශක්තිමත් පදනම, එක්සත්කම, ස්ථාවරත්වය සහ බෙදාගත් සමෘද්ධිය සඳහා වන අපගේ ජාතික කැපවීම ශක්තිමත් කර ඇත.

අද දින, ශ්‍රී ලංකාව ආරම්භ කර ඇත්තේ අපගේ ස්වෛරීභාවය සහ ජාතික අවශ්‍යතා ස්ථිරව ආරක්ෂා කරගනිමින්, වේගයෙන් පරිණාමය වන ජාත්‍යන්තර පද්ධතිය කෙරෙහි විශ්වාසයෙන් කටයුතු කරන, දියුණු හා ඉදිරි දැක්මක් ඇති ජාතියක් ගොඩනැගීම සඳහා වන නවමු ජාතික ගමනක් වේ. මෙම වගකීම අප වෙනුවෙන් පමණක් නොව, අද අප විසින් හැඩගස්වනු ලබන ජාතිය උරුම කර ගන්නා අනාගත පරම්පරාවන් සඳහා ද අප විසින් ඉටු කරනු ලබන්නකි.

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අඛණ්ඩව මෙහෙයවනු ලබන්නේ නොබැඳි පිළිවෙත, ජාත්‍යන්තර නීතියට ගරු කිරීම, සාමකාමී සහජීවනය සහ සියලු ජාතීන් සමඟ ඵලදායී සබඳතා පැවැත්වීම යන මූලධර්ම මගිනි. තිරසාර සංවර්ධනයට සහාය වන හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමට, අපගේ ජනතාවට පුළුල් අවස්ථා ලබා දීමට සහ කලාපීය හා ගෝලීය සාමය සහ සහයෝගීතාව උදෙසා අපගේ දායකත්වය වැඩි දියුණු කිරීමට අපි කැපවී සිටින්නෙමු.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ දරුණු අයහපත් කාලගුණික තත්ත්වයන්ගෙන් පැන නැගුණු මෑත කාලීන අභියෝග හමුවේ පවා, අපගේ ජනතාව විසින් පෙන්නුම් කරන ලද අප්‍රතිහත ධෛර්යය සහ එකමුතුභාවය මගින් නැවත වරක් ශ්‍රී ලංකාවේ නොසැලෙන ශක්තිය පිළිබිඹු කර ඇත. එක්ව, ප්‍රබල සහ ශක්තිමත් ජාතියක් නැවත ගොඩනැගීමේ අධිෂ්ඨානයෙන් යුතුව අපි ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

අතීත පසුබෑම් ජය ගැනීමට සහ නව අධිෂ්ඨානයකින් යුතුව ඉදිරියට ගමන් කිරීමට උත්සාහ කරමින්, අනාගත පරම්පරාවන්ට දීප්තිමත් අනාගතයක් සුරක්ෂිත කිරීම සඳහා, මෙය, සියලු ශ්‍රී ලාංකිකයින් එකමුතුකමේ සහ පොදු අරමුණක අධිෂ්ඨානයකින් එක්විය යුතු මොහොතක් වේ. මෙම නිදහස් දිනය, අපගේ අධිෂ්ඨානය ශක්තිමත් කරන, අප සාඩම්බරයෙන් සේවය කරන ජාතිය කෙරෙහි අපගේ කැපවීම තීව්‍ර කරන, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" පිළිබඳ අපගේ හවුල්කාරී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අපට මඟ පෙන්වන අවස්ථාවක් වනු ඇතැයි මම උදක්ම අපේක්ෂා කරමි!

විජිත හේරත්
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
2026.02.04

කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Republic Building, Colombo 01, Sri Lanka.